2024.09.02

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## නර්තනය (දේශීය)

විභාග අංකය :

| 06 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

Learning Resource Center
R
De Mazenod College
Kandana

### I කොටස

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **1 – 5 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පළමු පා සරඹ පදය වේ.
   (1) තෙයි කිට තෙයි තාම් (2) දොම් කිට කිට දොම් (3) තෙයි (4) තෙයියත්/// තාම්

2. "තත් ජිත් තොං නං තා" මෙය,
   (1) පළමු පා සරඹයේ කස්තිරමයි. (2) පළමු ගොඩ සරඹයේ කස්තිරමයි.
   (3) දෙවන ගොඩ සරඹයේ කස්තිරමයි. (4) පා සරඹ හමාර පදයයි.

3. තාලම් නැටුම්වල සුවිශේෂී ලක්ෂණයක් වනුයේ,
   (1) ගොඩ සරඹ පද නැටීම ය. (2) කවි ගායනා නොකිරීම ය.
   (3) කාන්තාවන් පමණක් නැටීම ය. (4) රංග භාණ්ඩ අතැතිව නැටීම ය.

4. නැළවිලි කවි ගායනා කළ යුත්තේ,
   (1) සාමූහිකව ය. (2) සාම්ප්‍රදායිකව ය. (3) සෙමින් ය. (4) ලයාන්විතව ය.

5. ද්‍රවිඩ ගැමි නැටුම කි.
   (1) කළගෙඩි (2) පතුරු (3) සෙම්බු (4) භරත

- **6 – 10 තෙක් ප්‍රශ්න සඳහා හිස් තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. පන්සල්, දේවාල, විහාරවල හේවිසි වාදනයට දවුල, තම්මැට්ටම, .......................... යොදා ගැනේ.
   (1) ගැටබෙරය (2) යක් බෙරය (3) හොරණෑව (4) තාලම්පට

7. තෛපොංගල් උත්සවය .......................... මාසයේ පවත්වයි.
   (1) ජනවාරි (2) පෙබරවාරි (3) අප්‍රේල් (4) දෙසැම්බර්

8. හනුමා වන්නම .................................. නටනු ලබයි.
   (1) මැදුම් තනි තිතට (2) සුළු තනි තිතට (3) මහ තනි තිතට (4) දෙතිතට

9. පා සරඹ සඳහා ඇති හමාර පද ගණන ........................
   (1) දෙක කි. (2) තුන කි. (3) එක කි. (4) හතර කි.

10. ශාරීරික අඟ පසඟ නම්‍යශීලීව හා අලංකාරව චලනය කිරීමට .................................. ප්‍රයෝජන ලබාගත හැකි ය.
    (1) නම්‍යතා අභ්‍යාසයෙන් (2) ගැමි නැටුමින්
    (3) වන්නම් නැටීමෙන් (4) පා සරඹ නැටීමෙන්

- **11 – 15 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් A තීරුවේ පද සමග සබඳතාවක් ඇති වචන B තීරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11. දණ්ඩියමේ සරඹ | ගැමි නැටුම කි. |
| 12. කෝලම් රටා | තාලම්පට |
| 13. කළගෙඩි නැටුම | හනුමා වන්නම |
| 14. තිත්, තෙයි | පා සරඹ |
| 15. කුද ගත ගත දොම් | තෛපොංගල් උත්සවය |

- **16 – 20 තෙක් ප්‍රශ්නවල සඳහන් වැකි හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.**

16. තනි තිතේ ප්‍රභේද හතර කි. ( )
17. මාත්‍රා 2 තාලයට හනුමා වන්නම නර්තනය කරයි. ( )
18. 'ලියට ඔබිය සුදු සේලය නෙරියා' මෙය කළගෙඩි කවිය කි. ( )
19. වෙසක් කූඩු හා තොරණ් අවුරුදු උත්සවයේ දී දක්නට ලැබේ. ( )
20. ගස්වැල්, දිය ඇලි තුළින් පරිසර සුන්දරත්වය පෙන්නුම් කරයි. ( )

(ලකුණු 1 × 20 = 20)

REGISTRAR
De Mazenod College
Kandana.

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## නර්තනය (දේශීය)

විභාග අංකය 2024.09.02

| 06 ශ්‍රේණිය | | II පත්‍රය |
|---|---|---|

- **පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **<u>පළමුවැනි</u> ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න <u>තුනකට</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

**1.** (i) හනුමා වන්නමේ ගායනයෙන් කියවෙන අදහස ලියන්න. එහි තිත නම් කරන්න.
(ii) ඉහත වන්මට අදාළ බෙර පදය සහ කවියක් ලියන්න.
(iii) හනුමා වන්නමේ කස්තිරම ලියන්න.

(ලකුණු 3 + 3 + 4 = 10)

**2.** (i) නමස්කාර අභ්‍යාසවල සුවිශේෂී ලක්ෂණ 2ක් ලියන්න.
(ii) ස්ථායී චලන හා සංචාරී චලන යන්න උදාහරණ සහිතව හඳුන්වන්න.
(iii) නර්තන කාමරය තුළ දී අනුගමනය කරන චාරිත්‍ර 2ක් ලියා, ගුරු ගෙදර අධ්‍යාපනය පිළිබඳ වැකි 3ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

**3.** (i) ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් 3 නම් කරන්න.
(ii) එම සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
(iii) එම නර්තන සම්ප්‍රදායන් 3 ප්‍රචලිත ප්‍රදේශ වෙන වෙන ම සඳහන් කරන්න.

(ලකුණු 3 + 3 + 4 = 10)

**4.** (i) දේශීය ගැමි නැටුම් 3ක් නම් කරන්න.
(ii) ගැමි කවියක් ලියන්න.
(iii) ගැමි නැටුම් දෙකකට අයත් උපකරණ දෙකක රූප සටහනක් අඳින්න.

(ලකුණු 3 + 3 + 4 = 10)

**5.** (i) වෙසක් උත්සවය පැවැත්වීමේ හේතු 2ක් ලියන්න.
(ii) එම උත්සවයේ දී එකමුතුකම විදහා දක්වන අවස්ථා 2ක් ලියන්න.
(iii) වෙසක් සැරසිලි 4ක් නම් කරන්න.

(ලකුණු 2 + 4 + 4= 10)

Learning Resource Center
R
De Mazenod College
Kandana